## 5. ශීර්ෂය 5 - අමාත්‍ය මණ්ඩල කාර්යාලය

-----------------------------------------------------------------

## 5.1 විගණන විෂය පථය

--------------------

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 15 දින අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**5.3 විගණන නිරීක්ෂණය**

**------------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.9,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ii)** වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.13,687,984 ක ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**----------------------------------------------------------------------**

වැටුපෙන් ණය වාරික අය කිරීමේදී ණය වර්ගය හා ගිවිස්නාව අනුව ණය වාරික අයකිරීම කළ යුතු වුවත් එසේ කටයුතු නොකළ අවස්ථා 04 ක් නිරීක්ෂණය විය.

**5.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**5.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**---------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2//3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.4.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**5.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**------------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**5.5 බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු බේරුම් නොකළ බැරකම් රු.255,507 ක් විය.

**5.6 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**--------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(i) රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපිය** | |
| 2011 නොවැම්බර් 15 දිනැති අංක 01 දරන ලිපියේ 02 ඡේදය | 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ( v ) උපඡේදය යටතේ සඳහන් කර ඇති නිලධාරී කාණ්ඩය හෝ නිලධාරියෙකුට රජයේ වියදමින් සන්නිවේදන පහසුකම් සැපයීමට හා බිල්පත් නිරවුල් කිරීමට අදහස් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් යෝජනාවක් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ ලබා ගත යුතු වුවත්, නිලධාරීන් 13 දෙනෙකු සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 5.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

-----------------------------------------

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

-----------------------------------------

කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| ලේඛන ගබඩාකරණ හා කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය | 9,000,000 | 2012 | ලේඛන ගබඩාකරණ හා කලමනාකරණ පද්ධතියකට වඩා පුළුල් e – cabinet ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට තීරණය කිරීම |

## 5.8 අවිධිමත් ගනුදෙනු

----------------------

කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

---------------------------------------------------------------

පරිගණක ජාලයට සවි කිරීම සඳහා ආරක්ෂිත උපකරණයක් (Fire wall) මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී දෙවන අඩුම මිල වන රු. 262,640 ඉදිරිපත් කළ ආයතනය උපකරණය සැපයීමට සති 05 ත් 06 ත් අතර කාලයක් ගතවන බැවින් එය ප්‍රතික්ෂේප කර හතරවන අඩුම මිල වන රු.400,120 ඉදිරිපත් කළ ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම ආයතනය උපකරණය සැපයීමට මාස 07 ක කාලයක් ගත කර තිබුණි. මේ අනුව හතරවන මිලට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ගත් තීරණයෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණු අතර ඒ වෙනුවෙන් රජයට රු.137,480 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) 2012 ජනවාරි 05 දින රු.1,344,000 කට මිලදී ගත් ඡායා පිටපත් යන්ත්‍රයේ වගකීම් කාලය අවුරුදු 03 ක් තිබියදී 2013 ජුනි 25 දින රු.270,648 ක් ද , 2014 ජනවාරි 30 දින රු.120,512 ක්ද අළුත්වැඩියා වෙනුවෙන් වැය කර තිබුණි.

## 5.9 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

-------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 10 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 29 | 22 | 07 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 27 | 02 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | 80 | 67 | 16 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.